පටුන

අනු අංකය	විස්තරය	පිටු අංකය
01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හැඳින්වීම	
1.1	දිස්ත්‍රික්කය හැඳින්වීම	02 - 05
1.2	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම, මෙහෙවර හා අරමුණු	06
1.3	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යභාරය	07
1.4	සංවිධාන ව්‍යුහය	08
1.5	ප්‍රාදේශීය ලේකම් කාර්යාල	09 - 10
1.6	දිස්ත්‍රික් ලේකම් කාර්යාල අධීක්ෂණය යටතේ පවතින අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු	11 - 43
1.7	විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති	43
02	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	44 - 48
03	වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය	
3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	49
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	50
3.3	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	51
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	52 – 60
3.5	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	61
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	62
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	62 – 63
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	64
3.9	විගණකාධිපති වාර්තාව	65 – 77
04	කාර්යසාධන දර්ශක	
4.1	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන දර්ශක	78
05	තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යසාධනය	
5.1	හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු	78 – 84
5.2	තිරසාර සංවර්ධන අරමුණු ජයග්‍රහණය සහ අභියෝග	85 – 88
06	මානව සම්පත් පැතිකඩ	
6.1	සේවක කළමනාකරණය	89
6.2	මානව සම්පත් අතිරික්තය හෝ පුරප්පාඩු පැවතීම ආයතනික කාර්ය සාධනය කෙරෙහි බලපෑම කෙටියෙන් විස්තර කරන්න	90
6.3	සේවක මණ්ඩල ධාරිතා වර්ධනය	90 – 92
07	අනුකූලතා වාර්තාව	93 - 97

01. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හැඳින්වීම

1.1 දිස්ත්‍රික්කය හැඳින්වීම

➢ දිස්ත්‍රික් සිතියම, දිස්ත්‍රික්කයේ මායිම් හා භූගෝලීය පිහිටීම

ශ්‍රී ලංකාවේ මධ්‍ය ප්‍රදේශය ලෙස සැළකෙන මාතලේ දිස්ත්‍රික්කය විශාලත්වයෙන් ව.කි.මී.1993.3 කින් සමන්විත වේ. මධ්‍යම පළාතේ උතුරු කොටස නියෝජනය කෙරෙන මාතලේ දිස්ත්‍රික්කය නැගෙනහිර දේශාංශ 80^0 28. සිට 80^0 59, දක්වා හා උතුරු අක්ෂාංශ 7^0 24, සිට 8^0 01 දක්වා පැතිර පවතී. උතුරෙන් අනුරාධපුරයද නැගෙනහිරින් පොලොන්නරුව, බදුල්ල හා අම්පාර ද දකුණින් මහනුවර ද, බටහිරින් කුරුණෑගල ද, යන දිස්ත්‍රික්කවලින් මායිම් වන මාතලේ, දිවයිනේ ස්වභාවික සම්පත්වලින් අනූන ප්‍රදේශවලින් එකකි.

මාතලේ යන නම ලැබීම සම්බන්ධයෙන් ජනප්‍රවාද කිහිපයක් පවතී. පණ්ඩුකාභය රජතුමා විසින් සිය මාමණ්ඩියට පැවරූ ප්‍රදේශය මා තුල ජනපදය පසුව මාතලේ වූ බව ඉන් එක ජනප්‍රවාදයකි. තවද ගජබා රජු දවස සොළී රට ආක්‍රමණය කර 12,000 ක් හෙවත් මහ තලයක් ගෙනවිත් පදිංචි කරවූ හෙයින් මහතලය මාතලේ වූ බව කියවේ. උස් කඳු මුදුන් වලින් වටවූ මහ තැනිතලාවක් වන බැවින් මහා තලාව මාතලේ වූ බව ද කියවෙන අතර මෙම මතය අද වුවත් පිළිගත හැකි කරුණකි.



ලොව අති විශිෂ්ට නිර්මාණයක් වූ සීගිරියද සොබා දහමේ අපූර්වතම දායාදයක් වන නකල්ස් කඳු වැටිය ද පිහිටි මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක් පුරා විහිදුනු ගම්මාන 1,373 කින් සමන්විත ලක්ෂ 05 කට අධික ජනගහනයක් වෙසෙන ප්‍රදේශයකි. ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ උතුරු අර්ධය නිරූපණය කරන මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටීම හා භූගෝලීය කරුණු මිණුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සිතියමේ (පරිමාණය 1:63360) - දඹුල්ල, නාලන්ද, කුරුණෑගල, පොළොන්නරුව, ඇළහැර හා රන්ගල යන අහලේ සිතියම් වලින් නිරූපණය කෙරේ.

කඳුකර පද්ධතියට අයත් කොට්සයිට්ල පියුම් බන්ඩිත නයිස්, ග්‍රනයිට්, කැලික්නයිස්, ස්ඵටික හුණුගල්, ඩොලමයිට් හා කොණ්ඩලයිට් වර්ගයට අයත් ගානට්, සිලමනයිට්, ෂිස්ට් හා ග්‍රැපයිට් යන පාෂාණ වලින් මාතලේ දිස්ත්‍රික්කය සමන්විත වේ. දිස්ත්‍රික්කයේ කඳු ආශ්‍රිත ප්‍රදේශ ඒකකයන් වශයෙන් ගත් කල මූලික පාෂාණ වර්ගය වානෝකයිටිය. මෙම මූලික පාෂාණ වර්ග කාලයක් ගතවීමේදී පෘථිවි අභ්‍යන්තරයේ ඇතිවන නොයෙක් බලපෑම් මත උඩු නැමිල විහේද හා යටි නැමිවලින් සංකීර්ණ ව්‍යුහ සාදයි. මෙම ලක්ෂණ නකල්ස් කඳුවැටිය ආශ්‍රිතව දැකිය හැකිය. බාදනයට එතරම් ඔරොත්තු නොදෙන හා පහසුවෙන් ජීර්ණය වන ගානට්, සිලිමනයිට් හා පෙල්ඩිස්පාර් වැනි පාෂාණ පිහිටීමේ ප්‍රතිඵලයක් ලෙස නකල්ස් හා හුන්නස්ගිරි කඳු ආශ්‍රිත ප්‍රදේශවල දරුණු නාය යෑම් ඇති වී තිබේ. මෙම ප්‍රදේශ වල වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1,900 ට වැඩි බැවින් මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය වී ඇත.

මාතලේ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සීමාවේ පිහිටි මහවැලි නිම්නය අසළ ප්‍රදේශය භූ වර්ගීකරණයට අනුව විජයන් ශ්‍රේණියට අයත් වේ. මහවැලි ගඟේ පිටාර තැන්නක් වන මෙම කලාපයේ විශේෂයෙන්ම අවසාදිත දියළු පස් තැන්පත්ව පවතී. මේ නිසා වී වගාවට ඉතා හිතකර ප්‍රදේශයක් ලෙස දිස්ත්‍රික්කයේ නැගෙනහිර අර්ධය පෙන්වා දිය හැක.

මාතලේ දිස්ත්‍රික්කයේ භූ විෂමතාවය සැලකීමේදී එය ප්‍රධාන කොටස් 3 කට බෙදා දැක්විය හැක.

1. උතුරු දිග තැන්න
2. මාතලේ ද්‍රෝණිය හා නකල්ස් ප්‍රදේශය
3. ලග්ගල සමාන්තර හෙල්වැටි

උතුරු දිග තැන්නට සාමාන්‍යයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, ගලේවෙල, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අයත් වේ. තැන් තැන් වල උස් කඳු හා ශේෂ කඳු වලින් පිරුණු මෙම ප්‍රදේශය සාමාන්‍යයෙන් තැනිතලාවක් හා රළු බිමක ලක්ෂණ පෙන්වයි. මෙම ප්‍රදේශයේ පිහිටි ශේෂ කඳු අතර සීගිරිය, දඹුල්ල, බෙලියකන්ද පුරාණයේ පටන්ම ප්‍රසිද්ධියක් උසුලයි. මෙම තැනිතලාව සාමාන්‍යයෙන් අඩි 500-1,000 ත් අතර උන්නතාංශයක් පෙන්වයි. මෙම රැලි බිමෙහි නිම්න අතුරින් ගලා යන ගංගා හරස් කර තැනූ වැව් රාශියක් පුරාණයේ තිබුණි. ඒ අතර කන්ඩලම, දේවහුව වැනි විශාල වැව් ප්‍රධාන වේ. මීට අමතරව ඉනාමළුව තල්කොටේ හා සීගිරිය වැනි කුඩා වැව් ද වෙති. මෙම තැන්නේ ගලා යන අතු ගංගා මඟින් රජරට වැව් පෝෂණය වේ. ඒ අතර කලා වැව හා මින්නේරිය වැව ප්‍රධාන වේ.

මාතලේ ප්‍රදේශය ද්‍රෝණියක් ලෙස භූ විද්‍යාත්මකව පෙන්වාදිය හැකිය. එයට ප්‍රධාන හේතුව කඳු වළල්ලකින් මාතලේ නගරය වට වී තිබීමයි. නකල්ස් , ගුරුළුහෙල- පන්සල් තැන්න, ඕවිලිකන්ද හා හුන්නස්ගිරි කඳු වැටියෙන් වට වී ඇති මාතලේ නගරය ආශ්‍රිත ප්‍රදේශ මෙසේ ද්‍රෝණියක පිහිටයි. මාතලේ නගරයේ සිට මෙය පැහැදිලිවම නිරීක්ෂණය කල හැකිය. මෙම ප්‍රදේශයේ භූ ලක්ෂණ සංකීර්ණ කරවමින් ගලා බසින ගංගාව සුදු ගඟ වේ. මෙම ගඟ ඉහත කී කඳු වැටි වලින් ගලා එන දිය දහරා රාශියකින් පෝෂණය වේ. මාතලේ සිට රත්තොට හරහා නැගෙනහිර දෙසට යන විට රළු භූ විෂමතාවයක් දක්වන නකල්ස් වැටිය හමු වේ. මීටි කරගත් හස්තයක ඇඟිලි මුදුන් ආකාරයට පිහිටි නිසා මෙම කඳු වැටියට ඒ නම ලැබී ඇත. සොබා සෞන්දර්යය අතින් ද දිවයිනේ කිසිදු ප්‍රදේශයකට නොදෙවෙනි වන මෙම ප්‍රදේශය දැඩි රක්ෂිතයක් ලෙස රජය විසින් නම් කර ඇත. මෙම වැටියේ පිහිටි හුදකලා කඳු අතර ලක්ගල හා කළු පහන කන්ද ප්‍රකටය.

නකල්ස් කඳු ප්‍රදේශය





නකල්ස් කඳු වැටියේ නැගෙනහිර බෑවුමේ පිහිටි කැපී පෙනෙන ලක්ෂණයකි. ලග්ගල සමාන්තර හෙල්වැටි කලාපය, නකල්ස් වැටියේ සිට ලග්ගල ප්‍රදේශයට සමාන්තරව උතුරු දෙසට විහිදෙන හෙල්වැටි 3 කින් මෙම කලාපය සමන්විත වේ. මින් එක් වැටියක් නකල්ස් හි තෙළඹුගල සිට වස්ගමුව දක්වා ද දෙවැනි වැටිය නකල්ස්හි වමාරපුගල සිට රණමුරේ හරහා අඹන්ගහ දක්වාද විහිදෙන අතර තෙවැනි වැටිය එතරම් පැහැදිලිව දැකිය නොහැකි වුවත් රඹුක්ඔළුව ප්‍රදේශයේ සිට ලග්ගල උඩසිය පත්තුව දෙසට විහිදෙයි. මෙම හෙල් වැටි වලින් ඇරඹෙන දිය දහර දිස්ත්‍රික්කයේ උතුරු සීමාවේදී අඹන්ගහට සම්බන්ධ වේ.

දිස්ත්‍රික්කයේ වනාන්තර ව්‍යාප්තිය ද සංකීර්ණය. එහි මධ්‍ය නිරිත හා බටහිර ප්‍රදේශ කඳුකර තෙත් කලාපීය වනාන්තර ද උතුරු හා ලග්ගල - විල්ගමුව ප්‍රදේශ පහතරට වියළි කලාපීය වනාන්තර වලින් ද සමන්විත වේ. ප්‍රධාන මෝසම් සුළං වර්ෂා 2 මඟින්ම වර්ෂාව ලැබුවත් වැඩි වර්ෂාපතනයත් ලැබෙන්නේ ඊසාන දිග මෝසම් සුළං මඟිනි. නකල්ස් වැටිය අසල පුළුල් ලෙව විවිධත්වයක් පෙන්නුම් කරන අතර මෙය ලංකාවේ ප්‍රධාන දායාදයක් ලෙස සැලකිය හැකිය. හෝර්ටන් තැන්නට බොහෝ සෙයින් සමාන එහෙත් විශාල නොමැති පතනක් පිටවල ආශ්‍රිතව පිහිටා ඇති අතර කුඩා ලෝකාන්තයද එහි එක් කෙලවරක පිහිටා ඇත.

මාතලේ දිස්ත්‍රික්කයේ මූලික තොරතුරු -2021

මුළු බිම් ප්‍රමාණය (ව.කි.මී)	1,993
ප්‍රා. ලේ කොට්ඨාස ගණන	11
ග්‍රාම නිලධාරී වසම් ගණන	545
ගම්මාන ගණන	1,483
මහා නගර සභා ගණන	02
ප්‍රාදේශීය සභා ගණන	11
පොලිස් ස්ථාන ගණන	10
ගොවිජන සේවා මධ්‍යස්ථාන	23
ජන්ද කොට්ඨාස	322
සංචාරක බංගලා	03
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්	
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්	05
පළාත් සභා මන්ත්‍රීවරුන්	00
පළාත් පාලන නියෝජිතයින්	284
ජනගහනය	
මුළු ජනගහනය	482,300
පුරුෂ	232,900
ස්ත්‍රී	249,400
ජන වර්ගය අනුව ජනගහනය	
සිංහල	80.8%
ලංකා දෙමළ	5%
ඉන්දියානු දෙමළ	4.8%
ශ්‍රී ලංකා යෝනක	9.2%
වෙනත්	0.2%
අධ්‍යාපනය	
අධ්‍යාපන කලාප ගණන	04
පාසල් ගණන	317
සිසුන් ගණන	102,986
ගුරුවරුන් ගණන	6,653
ගුරු අනුපාතය	15.5
සෞඛ්‍ය	
මහා රෝහල්	01
මූලික රෝහල්	01
ප්‍රාදේශීය රෝහල්	18
ප්‍රාථමික සෞඛ්‍ය සත්කාරක ඒකක	15
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල	11
මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාස	39
පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස	162
මාර්ග ව්‍යාප්තිය	
A ශ්‍රේණියේ මාර්ග	104.3Km
B ශ්‍රේණියේ මාර්ග	156.7Km
C,D,E ශ්‍රේණියේ මාර්ග	4,484.3Km
සිද්ධස්ථාන	
පන්සල්	424
කෝවිල්	95
මුස්ලිම් පල්ලි	52
කතෝලික දේවස්ථාන	17

➢ **දිස්ත්‍රික්කයේ වර්ෂාපතනය හා උෂ්ණත්වය**

අනු අංකය	වර්ෂාපතනය			උෂ්ණත්වය	
	මාසය	සාමාන්‍ය වර්ෂාපතනය (මි.මී)	ආර්ද්‍රතාවය % (දිනකට)	සාමාන්‍ය	උපරිම
01	ජනවාරි	145.7	82	18.4	30.3
02	පෙබරවාරි	27.3	72	16.4	31.4
03	මාර්තු	43.4	68	17.1	32.8
04	අප්‍රේල්	159.9	64	18.9	33.1
05	මැයි	306.8	79	20.7	32.5
06	ජූනි	118.6	73	19.9	31.2
07	ජූලි	191.8	78	20.2	31.3
08	අගෝස්තු	152.8	82	20.4	30.4
09	සැප්තැම්බර්	118.1	84	20.5	30.6
10	ඔක්තෝම්බර්	493.7	80	20.3	30.8
11	නොවැම්බර්	640.9	83	20.1	29.6
12	දෙසැම්බර්	46.4	82	18.9	31.0

සාමාන්‍ය වර්ෂාපතනය හා ආර්ද්‍රතාවය - 2021 ප්‍රස්ථාරිකව



සාමාන්‍ය උෂ්ණත්වය - 2021 ප්‍රස්ථාරිකව



1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

"ජනතා හිතවාදී පරිපාලනයක් ස්ථාපිත කිරීම තුලින් දිවයිනේ විශිෂ්ඨතම පරිපාලන මධ්‍යස්ථානය බවට පත්වීම."

මෙහෙවර

"මාතලේ දිස්ත්‍රික්කයේ ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව හා ඵලදාය ලෙස ඉටු කිරීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කරමින් ජාතික සංවර්ධනයට ප්‍රශස්ත ලෙස දායකවීම."

අගයන්

- **විනිවිදභාවය** - සියළුම කටයුතු සැලසුම්ගතව සහභාගිත්ව ක්‍රමවේද අනුගමනය කරමින් විස්වාසයෙන් කටයුතු කිරීම
- **කාර්යක්ෂමතාවය**- සෑම විටම සම්පත් වලින් උපරිම ප්‍රයොජන ගැනීම
- **සඵලදායිතාවය** - යම් කාර්යයක් නිවැරදි ලෙස ඉටුකිරීම.
- **වගකීම** - පැවරුණු නිශ්චිත රාජකාරිය අකුරටම ඉටුකිරීම
- **වගවීම** - නියමිත රාජකාරියෙන් ඔබ්බට ගිය නිර්මාණශීලී රාජකාරී පරිසරයක් නිර්මාණය කිරීම.
- **සමරූපීභාවය** - සියළුම මහජනතාවට සමාන ලෙස සැලකීම.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු

- දිස්ත්‍රික්කයේ සමාජ සුබසාධනය ඉහළ නැංවීම.
- දිස්ත්‍රික්කයේ සමාජ සංස්කෘතික හා සමාජ සංරක්ෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- දිස්ත්‍රික් කාර්යාලයේ අභ්‍යන්තර ක්‍රියාවලි වැඩි දියුණු කිරීම.
- දිස්ත්‍රික්කය තුළ රජයේ ඉඩම් කළමණාකරණය.
- දිස්ත්‍රික්කයේ විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම.
- දිස්ත්‍රික්කය තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ජීවනෝපාය සංවර්ධනය තුළින් සුරක්ෂිත ආර්ථික රටාවක් ගොඩනැගීම.
- දිස්ත්‍රික්කයේ ආගමික පුනරුදයට කටයුතු කිරීම.
- දිස්ත්‍රික්කයේ ජලපෝෂක ආරක්ෂා කිරීම හා පරිසර සංරක්ෂණය.
- අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන්ට තෘප්තිමත් කාර්යාල පරිශ්‍රයක් සකස් කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධ කටයුතු.
- දිස්ත්‍රික්කයේ ආපදා අවම කිරීමට කටයුතු කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ඵලදායිතා ප්‍රවර්ධනයට කටයුතු කිරීම.

ආදර්ශ පාඨය

"ජනතාව සඳහා විශිෂ්ඨ රාජ්‍ය සේවයක්"

කාර්යාල ලාංඡනය

AN EXCELLENT PUBLIC SERVICE FOR PUBLIC

DISTRICT SECRETARIAT
MATALE

කාර්යාල කොඩිය



1.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යභාරය

අනු අංකය	අංශය	කාර්යභාරය
01	ආයතන හා පාලන අංශය	❖ ප්‍රාදේශීය පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික් පරිපාලන කටයුතු මෙහෙයවීම. (නිලධාරීන්ට අදාල සියළුම ආයතනික කටයුතු, ග්‍රාම නිලධාරී ආයතන කටයුතු, වාහන සම්බන්ධ කටයුතු වැනි දෑ)
02	ගිණුම් අංශය	❖ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් මනා වූ කළමනාකරණයක් පවත්වාගෙන යාම.
03	ක්‍රමසම්පාදන අංශය	❖ ප්‍රාදේශීය මට්ටමින් සිදු කෙරෙන සියළුම ක්‍රමසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒවායෙහි ප්‍රගති පාලන කටයුතු සිදු කිරීම.
04	ඉඩම් අංශය	❖ ඉඩම් ගැටළුවලට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
05	සංවර්ධන අංශය	❖ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනයට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒවායෙහි ප්‍රගති පාලන කටයුතු සිදු කිරීම.
06	පුපුරණ ද්‍රව්‍ය පාලන අංශය	❖ ගිනි අවි බලපත්‍ර නිකුත් කිරීම, පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු.
07	කෘෂි අංශය	❖ දිස්ත්‍රික් කෘෂිකර්ම කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒ ආශ්‍රිත ගැටළු විසඳීමට කටයුතු කිරීම.
08	පුහුණු අංශය	❖ දිස්ත්‍රික් පරිපාලන කටයුතුවලට සම්බන්ධ දිස්ත්‍රික්කයේ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් ඇතුළුව සියළුම නිලධාරීන්ගේ මානව සම්පත් සංවර්ධන කටයුතු සිදු කිරීම. (පුහුණුව ලබාදීම, කුසලතා වර්ධනය)
09	අභ්‍යන්තර විගණන අංශය	❖ මූල්‍ය වංචා වැළැක්වීමට අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කිරීම
10	ඉංජිනේරු අංශය	❖ දිස්ත්‍රික්කයේ පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම වෙනුවෙන් වූ ප්‍රාග්ධන ආයෝජනයන්ට අදාල සියළුම ඉදිකිරීම් කටයුතු සැලසුම් කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම.
11	සමෘද්ධි අංශය	❖ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
12	ආපදා කළමණාකරන අංශය	❖ ආපදා කළමනාකරණ පෙර සූදානම් සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
13	බෞද්ධ කටයුතු අංශය	❖ දිස්ත්‍රික්කයේ අධ්‍යාත්මික සංවර්ධනය හා ජාතීන් අතර සුහදත්වය ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු මෙහෙයවීම.
14	මාධය අංශය	❖ දිස්ත්‍රික් තොරතුරු සම්පාදනය.
15	මිනිස්බල හා රැකී රක්ෂා අංශය	❖ වෘත්තීය නිපුණතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
16	සමාජ සේවා අංශය	❖ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, ආබාධිත, කාන්තා හා ළමා, රෝගාධාර, මුල් ළමා විය සංවර්ධන, පරිවාස හා ළමා කටයුතු ඉටු කිරීම
17	ඵලදායිතා අංශය	❖ දිස්ත්‍රික්කයේ ඵලදායිතා මිනුම් හා ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම
18	උපදේශන අංශය හා විමර්ෂන අංශය	❖ මිනිසුන්ගේ ගැටළු උපදේශනයන් හරහා විමර්ශනය කිරීම

1.4 සංවිධාන සටහන


දිස්ත්‍රික් ලේකම්/දිසාපති
දිස්ත්‍රික් අධ්‍යක්ෂ (කෘෂිකර්ම)
ප්‍රධාන ගණකාධිකාරි
අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්)
අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන)
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සමෘද්ධි අධ්‍යක්ෂ
දිස්ත්‍රික් ඉංජිනේරු
ප්‍රාදේශීය ලේකම්
සහකාර කෘෂි අධ්‍යක්ෂක
සහකාර මැතිවරණ කොමසාරිස්
ගණකාධිකාරි
අනෙකුත් අංශ
සහකාර දිස්ත්‍රික් ලේකම්
සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක
ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛන
සහකාර අධ්‍යක්ෂ සැලසුම්
සහකාර අධ්‍යක්ෂක
ගණකාධිකාරි
අඹන්ගහකොරළේ
උකුවෙල
ගලේවල
දඹුල්ල
නාඋල
පල්ලේපොල
මාතලේ
යටවත්ත
රත්තොට
ලග්ගල
විල්ගමුව
මොර්ටර් අංශය
කෘෂිකර්ම අංශය
මැතිවරණ අංශය
ගිණුම් අංශය
සංවර්ධන අංශය
ඉඩම් අංශය
බෞද්ධ කටයුතු අංශය
ආපදා සහන අංශය
ආපදා කළමනාකරණ අංශය
ව්‍යාවසාය සංවර්ධන අංශය
සමාජ සේවා අංශය
උපදේශන සේවා අංශය
ඵලදායිතා අංශය
ක්‍රීඩා අංශය
වනිතා කටයුතු අංශය
රැකියා කටයුතු අංශය
සංස්කෘතික අංශය
මාධ්‍ය අංශය
පාරිභෝගිකඅංශය
සමාජආරක්ෂක අංශය
විමර්ශන අංශය
ආයතන අංශය
පුහුණු අංශය
කොරතුරු තාක්ෂණ අංශ
පුපුරණ ද්‍රව්‍ය අංශය
සංඛ්‍යාලේඛන අංශය
සැලසුම් අංශය
විගණන අංශය
සමෘද්ධි අංශය
ඉංජිනේරු අංශය
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක නිලධාරි
ප්‍රධාන කළමනාකරණ සහකාර නිලධාරි
තොරතුරු තාක්ෂණ නිලධාරි
අංශ ප්‍රධානින්
සමෘද්ධි කළමනාකර
සමෘද්ධි කළ(විම ර්ශන)

1.5 ප්‍රාදේශීය ලේකම් කාර්යාල

➢ මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් පාලනය කෙරේ.

ප්‍රා.ලේ. කොට්ඨාසය	කොට්ඨාස මායිම	විශාලත්වය	ග්‍රාම සේවා වසම් ගණන	කොට්ඨාසයේ පවුල් ගණන	කාර්යාලීය කොඩි
උකුවෙල	• **උතුර** - රත්තොට හා මාතලේ ප්‍රා.ලේ.කොට්ඨාසය • **දකුණ** - මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර හා අකුරණ ප්‍රා.ලේ.කොට්ඨාස • **නැගෙනහිර** - නකල්ස් කඳුවැටියේ බටහිර බෑවුම • **බස්නාහිර** - කුරුණෑගල දිස්ත්‍රික් මායිම	ව.කි.මී. 73.26	73	20,467	
නාඋල	• **උතුර** - දඹුල්ල හා ගලේවෙල • **දකුණ** - මාතලේ හා අඔන්ගහකෝරළේ • **නැගෙනහිර** - ඇලහැර හා ලග්ගල • **බස්නාහිර** - පල්ලේපොල ප්‍රා.ලේ.කොට්ඨාසය	ව.කි.මී. 207.044	46	10,406	
මාතලේ	• **උතුර** - නාඋල ප්‍රා.ලේ.කොට්ඨාසය • **දකුණ** - උකුවෙල ප්‍රා.ලේ.කොට්ඨාසය • **නැගෙනහිර** - අඔන්ගහ හා රත්තොට ප්‍රා.ලේ.කොට්ඨාස • **බස්නාහිර** - යටවත්ත ප්‍රා.ලේ.කොට්ඨාසය	ව.කි.මී. 71.96	52	22,497	
දඹුල්ල	• **උතුර** - පලාගල හා කැකිරාව ප්‍රා.ලේ.කොට්ඨාසය • **දකුණ** - නාවුල ප්‍රා.ලේ.කොට්ඨාසය • **නැගෙනහිර** - හිගුරක්ගොඩ හා ඇළහැර ප්‍රා.ලේ.කොට්ඨාස • **බස්නාහිර** - ගලේවෙල ප්‍රා.ලේ.කොට්ඨාසය	ව.කි.මී. 456.3	59	24,233	
ලග්ගල	• **උතුර** - නාඋල හා ඇලහැර ප්‍රා.ලේ.කොට්ඨාසය • **දකුණ** - මහනුවර දිස්ත්‍රික් මායිම • **නැගෙනහිර** - විල්ගමුව ප්‍රා.ලේ.කොට්ඨාස • **බස්නාහිර** - අඔන්ගහකෝරළේ හා රත්තොට ප්‍රා.ලේ.කොට්ඨාසය	ව.කි.මී. 375	37	5,835	

අඹන්ගඟ	• **උතුර** - නාඋල ප්‍රා.ලේ.කොට්ඨාසය • **දකුණ** - රත්තොට ප්‍රා.ලේ.කොට්ඨාසය • **නැගෙනහිර** - ලග්ගල ප්‍රා.ලේ.කොට්ඨාසය • **බස්නාහිර** - මාතලේ ප්‍රා.ලේ.කොට්ඨාසය	ව.කි.මී. 94.93	20	5,603	
රත්තොට	• **උතුර** - අඹන්ගඟකෝරලේ ප්‍රා.ලේ.කොට්ඨාසය • **දකුණ** - උකුවෙල ප්‍රා.ලේ.කොට්ඨාසය • **නැගෙනහිර** - ලග්ගල ප්‍රා.ලේ.කොට්ඨාස • **බස්නාහිර** - මාතලේ ප්‍රා.ලේ.කොට්ඨාසය	ව.කි.මී. 104.88	54	20,434	
යටවත්ත	• **උතුර** - පල්ලේපොල ප්‍රා.ලේ.කොට්ඨාසය • **දකුණ** - උකුවෙල ප්‍රා.ලේ.කොට්ඨාසය • **නැගෙනහිර** - මාතලේ ප්‍රා.ලේ.කොට්ඨාස • **බස්නාහිර** - කුරුණෑගල දිස්ත්‍රික්කය	ව.කි.මී. 65.7	56	9,968	
ගලේවෙල	• **උතුර** - අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල ප්‍රා.ලේ.කොට්ඨාසය • **දකුණ** - පල්ලේපොල හා නාඋල ප්‍රා.ලේ.කොට්ඨාසය • **නැගෙනහිර** - දඹුල්ල ප්‍රා.ලේ.කොට්ඨාස • **බස්නාහිර** - කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව පොල්පිතිගම ප්‍රා.ලේ.කොට්ඨාස	ව.කි.මී. 192.4	59	24,685	
පල්ලේපොල	• **උතුර** - ගලේවෙල ප්‍රා.ලේ.කොට්ඨාසය • **දකුණ** - යටවත්ත ප්‍රා.ලේ.කොට්ඨාසය • **නැගෙනහිර** - නාඋල ප්‍රා.ලේ.කොට්ඨාස • **බස්නාහිර** - කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රා.ලේ.කොට්ඨාසය	ව.කි.මී. 80.5	46	10,413	
විල්ගමුව	• **උතුර** - උතුරුමැද පළාත් සීමාව • **දකුණ** - මිනිපේ ප්‍රා.ලේ.කොට්ඨාසය • **නැගෙනහිර** - මහවැලි ගඟ • **බස්නාහිර** - ලග්ගල ප්‍රා.ලේ.කොට්ඨාසය	ව.කි.මී. 256	39	10,443	

1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාල අධීක්ෂණය යටතේ පවතින අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු

➢ **ඉඩම් අංශය**

අ.අ.	ක්‍රියාත්මක සැලැස්මට අනුව වගකීම් ක්ෂේත්‍රය/ ක්‍රියාකාරකම	වෙන් කළ ප්‍රතිපාදන (රු.)	වැය කළ මුළු ප්‍රතිපාදන (රු.)	අපේක්ෂිත ප්‍රතිලාභී කණ්ඩායම	ප්‍රගතිය
01	ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනතට අනුකූලව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ක්‍රියාත්මක වීමේදි මතුවන ගැටලු සම්බන්ධීකරණය කිරීම	-	-	190	ඉඩම් ගැටලු විසදීමේ ජංගම සේවා වෙත යොමු වී ඇති ගැටලු විසදීම සඳහා එම ගැටලු හඳුනා ගෙන අදාළ ආයතන වෙත යොමුකිරීම හා ගැටලුව විසදීමට අදාළ තීරණ ලබාදීම. ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබාදීම. සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල දීර්ඝ කාලයක් තිස්සේ නොවිසදි තිබූ ඉඩම් ගැටලු හඳුනාගෙන ඒකාබද්ධ ප්‍රවේශයක් තුලින් 2021 වර්ෂය සඳහා ගැටලු විසදීමේ වැඩසටහන් පැවැත්විය
02	සළුලදායි අධීක්ෂණය	-	-		සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල දීර්ඝ කාලයක් තිස්සේ නොවිසදි තිබූ ඉඩම් ගැටලු හඳුනාගෙන ඒකාබද්ධ ප්‍රවේශයක් තුලින් විසදීමේ වැඩසටහන් පවත්වා ඒ සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා අදාළ ප්‍රගතිය කැදවීම හා විමර්ශනය කිරීම හා පසු විපරම් කිරීම.
03	කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අංක 4/1//1/1 හා 2005.12.30 සහ 2006.03.29 දිනැති චක්‍රලේඛ වලට අනුකූලව දැව හෙලීම් සිදුවන්නේ දැයි පරීක්ෂා කිරීම.	-	-	හෙලීමට අනුමත කර ඇති කොස් ගස් සංඛ්‍යාව 238කි.	කොස්, දෙල් හා ගැහැණු තල් ගස් 03 කට වඩා වැඩි හෙලීම් සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත් පරීක්ෂා කර බලා හෙලීම් බලපත්‍ර සඳහා අනුමැතිය ලබාදීම.
04	දිස්ත්‍රික් වන්දි කමිටුවට අදාළ කටයුතු	ප්‍රතිපාදන 3,000,000.00 ලද අග්‍රිම 500,000.00 8,000.00 (සංග්‍රහ වියදම්)	3,391,549.00 (වන්දි ගෙවීමට) ඉතිරි. 116,451.00 (සංග්‍රහද ඇතුළුව)) 4540/- (සංග්‍රහ වියදම්)	76	වන අලි හානි සඳහා ලද වන්දි අයදුම්පත් වන්දි කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම.

05	සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන හා මහජනතාව අතර සම්බන්ධීකරණය සිදු කිරීම.			12	වන්දි ගෙවීම් සම්බන්ධයෙන් අගතියට පත්වූවන්ගේ ගැටළු ජංගම සේවය මඟින් අදාළ ව්‍යාපෘති ආයතන හා දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් සම්බන්ධීකරණයෙන් විසඳීම සඳහා කටයුතු කිරීම. අභියාචනාකරුවන් වෙත උපදෙස් හා තීරණ ලබාදී ගැටලු විසඳීමට කටයුතු කරන ලදි.

➢ දිස්ත්‍රික් පරිසර කටයුතු

අ. අ.	වැඩසටහන	වැඩසටහන පිළිබඳ විස්තරය
1	දිස්ත්‍රික් පරිසර කමිටුව	ජනාධිපති ලේකම් ගේ අංක PS/DSP/ENV/2/7/9 හා 2019.03.18 දිනැති ලිපියේ උපදෙස් පරිදි දිස්ත්‍රික් පරිසර කමිටුව සෑම මසකම දෙවන අඟහරුවාදා පැවැත්විය යුතු බවත්, එහි වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලයට යැවිය යුතු බවත් දන්වා ඇත. ඒ අනුව දිස්ත්‍රික් පරිසර කමිටුව මඟින් මාතලේ දිස්ත්‍රික්කයේ පවතින පරිසර ගැටළු හඳුනා ගැනීම, සාකච්ඡා කිරීම සහ ගිවිසුම් ලබා ගැනීම අදාල සියළුම පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් සිදු කරනු ලබන අතර එහි වාර්තාව ජනාධිපති කාර්යාලයට යොමු කර ඇත.
2	දිස්ත්‍රික් වන ගහණය වර්ධනය කිරීමේ මාතලේ දිස්ත්‍රික් සැලසුම	පසුගිය වසර පහක කාලය තුළ සිට මාතලේ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් වන සෘණත්වය අඩුවීමත් මෙන්ම වන සතුන්ට සිය වාසස්ථාන අහිමි වීමත් නිසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. එසේම මධ්‍යම කඳුකරයේ භායනයට ලක් වූ කඳු හා ජල පෝෂක ආරක්ෂා කිරීමටත් මාතලේ දිස්ත්‍රික්කයේ මෙතෙක් හඳුනා නොගත්, එහෙත් අත්‍යාවශ්‍ය වශයෙන් හඳුනා ගත යුතු ජල මූලාශ්‍ර වශයෙන් පවතින ස්ථාන සංරක්ෂණය කිරීමත් සඳහා තොරතුරු රැස් කර ගැනීම සඳහා රැස්වීමක් 2021.11.30 දින පවත්වන ලදි.

➢ සංවර්ධන අංශය

➢ සමාජ සේවා අංශය

- 2021 සමාජ සේවා දෙපාර්තමේන්තුව හා ආබාධ සහිත තැනැත්තන් සඳහා මහලේකම් කාර්යාලය මඟින් ලබාදුන් සේවා

අ.අ	වැඩසටහන	ලබා දුන් සංඛ්‍යාව	ලැබූ ප්‍රතිපාදන මුදල රු.	වියදම රු.
01	ආබාධ සහිත පුද්ගලයින් සඳහා විශේෂ වැසිකිළි හා ප්‍රවේශ පහසුකම් සඳහා සෘජු ආධාර ලබා දීම.	08	231,000.00 (සමාජ සේ.දේ.)	230,900.00
02	ආබාධ සහිත පුද්ගලයින් වෘත්තීය පුහුණු සඳහා යොමු කිරීම සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.	92	15,780.00	15,780.00
03	ආබාධ සහිත පුද්ගලයින්ගේ ස්වඅභිමානී වැඩ සටහන හා ප්‍රගති සමාලෝචනය.	8	38,000.00	38,000.00
04	ස්වේච්ඡා සේවක පුහුණු වැඩසටහන	01	85,860.00	84,600.00
05	වකුගඩු රෝගීන් සඳහා රු.5,000/- මාසික ජීවනාධාර ලබා දීම.	2,471	රු.5,000/- බැගින් මාසිකව	
06	ආබාධ සහිත පුද්ගලයින් සඳහා රු.5,000/- මාසික ජීවනාධාර ලබා දීම.	2,341	රු.5,000/- බැගින් මාසිකව	
07	තනි මා පිය ස්වයං රැකියා ලබා දීම.	3	84,000.00	84,000.00
08	තනි මා පිය අධ්‍යාපන ආධාර ලබා දීම.	75	693,191.50	693,191.50
09	වෛද්‍යාධාර ලබා දීම	22	363,000.00	363,000.00
10	අධ්‍යාපන ආධාර ලබා දීම.(ආබාධ සහිත)	19	176,793.50	176,793.50
11	නිවාස ආධාර ලබා දීම	3	200,000.00	200,000.00

➢ **බෞද්ධ කටයුතු අංශය**

අ.අ.	වැඩසටහන	ප්‍රා.ලේ.කො	ව්‍යාපෘතිය	ලබා දුන් ප්‍රතිපාදන මුදල (රු)	වියදම් මුදල (රු)	ඉතිරි මුදල (රු)	වෙනත්
01	ඌණ සංවර්ධිත විහාරස්ථාන සංවර්ධන වැඩසටහන	පල්ලේපොල, දඹුල්ල, විල්ගමුව, උකුවෙල, රත්තොට, ගලේවෙල, යටවත්ත, නාඋල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ	ඌණ සංවර්ධිත විහාරස්ථාන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 15	5,400,000.00	5,400,000.00	5,400,000.00	
02	අභයපත් කාලගුණයෙන් ආපදාවට පත් විහාරස්ථාන සංවර්ධනය කිරීම	උකුවෙල, ගලේවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ	අයහපත් කාලගුණයෙන් ආපදාවට පත් විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම	11,000,000.00	11,000,000.00	11,000,000.00	
03	ඌණ සංවර්ධිත දහම් පාසල් වැඩි දියුණු කිරීම	පල්ලේපොල, දඹුල්ල, විල්ගමුව, උකුවෙල, රත්තොට, යටවත්ත, නාඋල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ	ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 20	7,550,000.00	6,450,000.00	11,000,000.00	දහම් පාසල් 7ක ප්‍රතිපාදන ආපසු බුද්ධ ශාසන අමාත්‍යාංශය වෙත යවන ලදි.
04	දහම් පාසල්උපකරණ ලබා දීම	උකුවෙල, යටවත්ත යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ	ඌණ සංවර්ධිත දහම් පාසල් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ දහම් පාසල් උපකරණ ලබා දීම ව්‍යාපෘති 02	300,000.00	300,000.00	-	
05	පුණ්‍යාග්‍රාම වැඩසටහන	ලග්ගල පල්ලේගම	ශ්‍රී නාග රුක්ඛාරාම විහාරස්ථානයේ දහම් පාසල් වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම	250,000.00	250,000.00	250,000.00	
		දඹුල්ල, විල්ගමුව, නාඋල , අඹන්ගහකෝරළේ	පුණ්‍යාග්‍රාම වැඩසටහන ක්‍රියාත්මක විහාරස්ථානවල දහම් පාසල් සඳහා ප්‍රස්තකාල උපකරණ ලබා දීම	460,000,00	460,000.00	-	
		දඹුල්ල, නාඋල, අඹන්ගහකෝරළේ, ලග්ගල, උකුවෙල, දිස්ත්‍රික් ලේකම් කාර්යලය	පුණ්‍යාග්‍රාම පරිපාලන වියදම් සඳහා	39,350.00	39,350.00	-	
		දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තිරසාර පුණ්‍යාග්‍රාම වැඩසටහන යටතේ ක්‍රියාත්මක ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සඳහා	25,000,00	25,000.00	-	
		දඹුල්ල, උකුවෙල, නාඋල , අඹන්ගහ කෝරළේ ප්‍රා. ලේකම් කොට්ඨාශ තුළ	අධ්‍යාත්මික වැඩසටහන් 60 ක්‍රියාත්මක කිරීම	343,500.00	308,500.00	35,000.00	

06	ආදාහන පුජෝත්සව	පල්ලේපොල, දඹුල්ල, විල්ගමුව, ගලේවෙල, නාඋල, මාතලේ, යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ	ප්‍රාදෙශීය ලේකම් කොට්ඨාශ 06ක ස්වාමීන් මහන්සේලා 09 දෙනෙක් සඳහා	77,500.00	77,500.00	-	
07	සිල්මාතා රැස්වීම් සඳහා	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	මාතලේ දිස්ත්‍රික් සිල්මාතා සංගමයේ රැස්වීම් වාර තුනක් සඳහා ගමන් වියදම් ගෙවීම	78,000.00	16,500.00	61,500.00	කොවිඩ් 19 හේතුවෙන් රැස්වීම් පැවැත් වීමට නොහැකි වීම
08	දහම් සරසවිය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ නාඋල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව සමාරම්භක උත්සවය සහ පොදු පහසුකම් සඳහා	45,000.00	30,000.00	15,000.00	
09	ශාසනාරක්ෂක මණ්ඩල උපකරණ සඳහා	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, උකුවෙල, පල්ලේපොල, ගලේවෙල, ලග්ගල	ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු පහසුකර ගැනීම සඳහා පහසුකම් සැලසීම යටතේ උපකරණ ලබා ගැනීම	545,000,00	545,000,00	545,000,00	
10	දහම් පාසල් ගුරු දීමනා සඳහා	මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11 සඳහා	මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11 ගුරු භවතුන් 3760 සඳහා ගුරු දීමනා ගෙවීමට	18,720,000.00	18,540,000.00	180,000.00	
10	දහම් පාසල් පෙළ පොත් ලබා දීම	මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11	මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11දහම් පාසල් සඳහා	169,450.00	82,231.81	92,092.74	-
11	ලිපිද්‍රව්‍ය මිලදි ගැනීම	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බෞද්ධ කටයුතු නිලධාරින් 25 දෙනා සඳහා	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල බෞද්ධ කටයුතු නිලධාරින් 25 දෙනා සඳහා ලිපිද්‍රව්‍ය මිලදි ගැනීම සඳහා	56,700,00	56,700,00	-	
12	මාසික රැස්වීම සඳහා	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	බෞද්ධ කටයුතු නිලධාරින්ගේ තෛමාසික රැස්වීම් පැවැත් වීම සඳහා	12,000.00	12,000.00		

➢ සංස්කෘතික අංශය

අ.අ	දෙපාර්තමේන්තුව/ ආයතනය	ව්‍යාපෘතිය	වැඩසටහන	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	වෙන් වූ ප්‍රතිපාදන	වැඩ අවසන් වූ ව්‍යාපෘති සංඛ්‍යාව	වියදම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	සර්ව ආගමික වැඩසටහන	ජාතික නිදහස් දින සැමරුමට සමගාමීව සර්ව ආගමික නායකයින් කැඳවමින් දැනුවත් කිරීමේ වැඩසටහනක් දි.ලේ.කාර්යාලයේ දි පැවැත්වීම	01	10,000.00	01	10,000.00	200
02	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	කලායතන ආධාර ලබා දීම	මාතලේ දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරි කලායතන සඳහා ආධාර ලබා දීම	01	186,500.00	01	186,500.00	35
03	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	ආධාර අවශ්‍ය කලාකරුවන් සඳහා ආධාර ලබා දීම	මාතලේ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභි කලාකරුවන් සඳහා ආධාර ලබා දීම	01	1,060,000.00	01	1,060,000.00	106
04	සංස්කෘති කටයුතු දෙපාර්තමේන්තුව	ප්‍රාදේශිය හා දිස්ත්‍රික් සාහිත්‍ය උත්සව පැවැත්වීම	ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සාහිත්‍ය උත්සවය වෙනුවෙන් නිර්මාණ ලබාදෙන ලද නිර්මාණකරුවන් අගයමින් සාහිත්‍යධරයන් හා කලාකරුවන් ගේ සහභාගිත්වයෙන් සාහිත්‍ය උත්සවය පැවැත්වීම	12	625,500.00	12	625,500.00	1600
05	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	දොළොස් මහේ පහන	සංස්කාතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් වසරේ එක් එක් මාස සහා නිර්මාණ ශීලි වැඩසටහන් සිදුකිරිමට ලබා දි ඇත. මේ යටතේ සෞන්දර්ය ළමා සමාජ පිහිටුවීම, ගී රස වින්දන වැඩසටහන් පැවැත්වීම, හිටිවන කවි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම, ගොක් කලා නිර්මාණ වැඩසටහන් පැවැත්වීම, කලා කරු සුවදම් වැඩසටහන	32	300,000.00	24	300,000.00	2500
06	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	අවමංගල්‍යාධාර ලබා දීම	මියගිය කලාකරුවන් සඳහා ආධාර මුදල් ලබා දීම	03	80,000.00	03	80,000.00	3
07	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	කලාකරු සුවදම් වැඩසටහන	කලාකරුවන් ගේ සුවදුක් විමසිම	110	198,000.00	110	198,000.00	110
08	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	වෛද්‍යාධාර ලබා දීම	අසනිප තත්ත්වයේ පසුවන කලාකරුවන් සඳහා මුදල් ආදාර ලබා දීම	02	20,000.00	02	20,000.00	2
09	සංස්කෘතික අමාත්‍යාංශය	පුස්තකාල සඳහා පොත් ලබා දීමේ උත්සවය	මාතලේ දිස්ත්‍රික්කයේ පවතින ජාතික පාසල්, පළාත් සභා පාසල්. මහනගර සභා හා පලාත් පාලන පුස්තකාල සඳහා පොත් කට්ටල	01	35,000.00	59	35,000.00	150

			ලබාදීම					
10	සංස්කෘතික අමාත්‍යාංශය	ග්‍රාමීය කලා කව පිහිටුවීම	ග්‍රාමීය කලා කව පිහිටුවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	11	98,802.00	09	80,028.00	400
11	හින්දු ආගමික‍සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	කෝවිල් ප්‍රතිසංස්කරණ කටයුතු	මාතලේ දිස්ත්‍රික්කයේ කෝවිල් ප්‍රතිසංස්කරණය	23	2,210,000.00	23	2,210,000.00	4500
12	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	දහම් පාසල් සහා උපකරණ ලබා දීම	මාතලේ හින්දු දහම් පාසල් දරුවන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සිදුකිරීම	02	100,000.00	02	100,000.00	300
13	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	දහම් පාසල් ගොඩනැගිලි ඉදිකරීම	දහම් පාසල් 02ක් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම	02	400,000.00	02	400,000.00	400
14	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	තෛපොංගල් උත්සවය	සහජීවනය සඳහා හා හිරු දෙවියන් වන්දනා කිරීමේ උත්සවය වන තෛපොංගල් උත්සවය සැමරීම	06	60,000.00	06	60,000.00	1000
15	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	මහ ශිව රාත්‍රී උත්සවය	ශිව දෙවියන් වන්දනා කිරීම සහා වන ස්තෝත්‍ර මංගල්‍යය පැවැත්වීම	01	50,000.00	01	50,000.00	200
16	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	දහම් පාසල් පුස්තකාල උපකරණ ලබා දීම	හින්දු දහම් පාසල් 02 ක් සඳහා උපකරණ ලබා දීම	02	40,000.00	02	40,000.00	400
17	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	ගුරු පුජා උත්සවය	ආගමික මෙහෙවර ඇගයීම සඳහා ආගමික නායකයින් අනුස්මරණය කිරීම	01	10,000.00	01	10,000.00	50
18	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම	දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීම	01	50,000.00	01	50.000.00	100
19	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	දිව්‍යාග්‍රාම වැඩසටහන	දහම් පාසල් දරුවන් දැනුවත් කිරීම	01	50,000.00	01	50,000.00	300
20	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	දේවාල පූජකවරුන් සඳහා ද්‍රව්‍යාදාර ලබා දීම	කෝවිඩ් වසංගත තත්ත්වය යටතේ අසරණ වූ පූජකවරුන් සඳහා වියලි ආහාර ද්‍රව්‍ය ලබා දීම	15	75,000.00	15	75,000.00	15

➢ ළමා ආරක්ෂක අධිකාරිය

අ.අ.	ක්‍රියාත්මක සැළැස්මට අනුව වගකීම් ක්ෂේත්‍රය/ ක්‍රියාකාරකම්	ප්‍රා.ලේ කොට්ඨාසය	වෙන් කල ප්‍රතිපාදන (රු.)	වැයකල මුළු ප්‍රතිපාදන (රු.)	අපේක්ෂිත ප්‍රතිලාභී කණ්ඩායම	ප්‍රගතිය
01	පාසල් ළමා ආරක්ෂණ කමිටු	දි.ලේ.කා	24,000.00	24,000.00	පාසල් දරුවන්	ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත්වීම හා අවශ්‍ය දරුවන් සඳහා අධ්‍යාපන උපකරණ හිමිවීම
		ප්‍රා.ලේ.කොට්ඨාස 11	20,000 * 11= 220,000.00	20,000 * 11= 220,000.00		
02	වෘත්තියවේදීන් පුහුණු කිරීම					
	ළමා වෙළඳාම හඳුනාගැනීම, වැළැක්වීම හා විමර්ශනය කිරීම පිළිබඳ පොලිස් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන	ප්‍රා.ලේ කොට්ඨාස 11 දරුවන්	125,000.00	125,000.00	දිස්ත්‍රික්කයේ ළමා ප්‍රජාව	අවදානම් හා විත්දිත දරුවන් වෙනුවෙන් නිවැරදිව මැදිහත්වීම සඳහා අවශ්‍ය දැනුම ලැබීම හා නිසි සම්බන්ධීකරණය
03	හදිසි ආපදා තත්වයන්හිදී ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩසටහන	ප්‍රා.ලේ කොට්ඨාස 11 දරුවන්	30,000.00	30,000.00	දිස්ත්‍රික්කයේ ළමා ප්‍රජාව	ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත්වීම හා අවශ්‍ය දරුවන් සඳහා අධ්‍යාපන උපකරණ හිමිවීම
04	ප්‍රාදේශීය මට්ටමින් ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩසටහන (සිප් සවියට සිත්දහසක් වැඩසටහන)	දඹුල්ල, විල්ගමුව	33,810.00	33,810.00	දිස්ත්‍රික්කයේ අවදානම් සහිත ළමා ප්‍රජාව	අවශ්‍යතා සහිත දරුවන් සඳහා අවශ්‍ය භෞතික හා වෙනත් සහයන් ලබාදීම
		පල්ලේපොල	15,600.00	15,600.00		
		ලග්ගල පල්ලේගම	12,765.00	12,765.00		
		මාතලේ	20,000.00	20,000.00		
		උකුවෙල	25,000.00	25,000.00		
		යටවත්ත	19,320.00	19,320.00		
		අඹන්ගහකෝරළේ	6,900.00	6,900.00		
		රත්තේට	18,630.00	18,630.00		
		නාඋල	17,940.00	17,940.00		
05	පාසල් මාධ්‍ය සමාජ දැනුවත් කිරීමේ වැඩසටහන	යටවත්ත	20,000.00	20,000.00	යටවත්ත වීර පරාක්‍රමබාහු මධ්‍ය මහා විද්‍යාලයේ දරුවන්	යහපත් මාධ්‍ය භාවිතාවක් සඳහා දරුවන් යොමු කිරීම
06	විගමනික ශ්‍රමිකයින්ගේ නව යොවුන් වියේ පසුවන ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩසටහන	මාතලේ යටවත්ත	60,000.00	60,000.00	විදෙස්ගත ශ්‍රමිකයින්ගේ දරුවන්	ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත්වීම
07	විත්දිත ආන්තික දරුවන් සඳහා (1929 පැමිණිලිවල විත්දිත දරුවන්) සහන සැලසීම	දඹුල්ල	24,000.00	24,000.00	1929 ළමා උපකාරක සේවය තුළින් සහන ලද දරුවන්	ළමා ආරක්ෂාව තහවුරු කිරීම
		මාතලේ	6,000.00	6,000.00		
		ගලේවෙල	9,000.00	9,000.00		
08	ළමා ආරක්ෂණ ආදර්ශ ගම්මාන වැඩසටහන	අඹන්ගහකෝරළේ	3,750.00	3,750.00	ළමා ප්‍රජාව	
09	වෛරස් ආරක්ෂක මෘදුකාංග	රත්තොට	1,890.00	1,890.00	ළමා ආරක්ෂක නිලධාරීන්	ළමා ආරක්ෂක නිලධාරීන්ගේ කාර්යන්හි ඵලදායිබව
		දි.ලේ.කා	2,600.00	2,600.00		
එකතුව			**656,205.00**	**656,205.00**		

➢ **විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

අ.අ.	ප්‍රා.ලේ. කාර්යාලය	පුහුණු ශ්‍රමික බලකාය				මෙරට පැමිණි ශ්‍රමිකයන් සමාජගත කිරීම				සුරක්ෂිත සංක්‍රමණය හා මිනිස් වෙළඳාම			
		ප්‍රතිපාදන	වැඩසටහන්	ප්‍රතිලාභීන්	වියදම	ප්‍රතිපාදන	වැඩසටහන්	ප්‍රතිලාභීන්	වියදම	ප්‍රතිපාදන	වැඩසටහන්	ප්‍රතිලාභීන්	වියදම
01	මාතලේ	10,000.00	01	90	10,000.00	4,000.00	01	01	4,000.00	10,000.00	01	70	10,000.00
02	යටවත්ත	-	-	-	-	16,000.00	04	21	16,000.00	10,000.00	02	60	10,000.00
03	පල්ලෙපොල	-	-	-	-	-	-	-	-	10,000.00	02	80	10,000.00
04	ගලේවෙල	6,000.00	01	42	6,000.00	34,000.00	06	22	34,000.00	10,000.00	02	100	10,000.00
05	දඹුල්ල	8,000.00	01	50	8,000.00	14,000.00	02	22	14,000.00	10,000.00	02	140	10,000.00
06	නාඋල	-	-	-	-	5,000.00	01	10	5,000.00	10,000.00	01	40	10,000.00
07	විල්ගමුව	-	-	-	-	6,000.00	01	05	6,000.00	10,000.00	01	50	10,000.00
08	ලග්ගල	-	-	-	-	-	-	-	-	10,000.00	01	50	10,000.00
09	අඹන්ගහකෝරළේ	-	-	-	-	7,000.00	01	06	7,000.00	10,000.00	03	85	10,000.00
10	රත්තොට	4,000.00	01	35	4,000.00	8,000.00	03	04	8,000.00	10,000.00	01	68	10,000.00
11	උකුවෙල	22,000.00	01	160	22,0000.00	6,000.00	02	09	6,000.00	10,000.00	02	107	10,000.00
	එකතුව	**50,000.00**	**05**	**377**	**50,000.00**	**100,000.00**	**21**	**100**	**100,000.00**	**110,000.00**	**18**	**850**	**110,000.00**

▪ **විදේශ රැකියා සංවර්ධන නිලධාරී පුහුණු වැඩසටහන් වෙනුවෙන් වියදම් වූ මුදල**

කාර්යාලය	ප්‍රතිපාදන	වියදම	සහභාගීත්වය	පැවැත්වූ දිනය
රත්තොට	5,320.00	5,320.00	14	2021/11/29
දඹුල්ල	9,700.00	9,700.00	20	2021/11/28

➢ වැඩිහිටි සංවර්ධන අංශය

- **භාණ්ඩාගාර මුදල් ප්‍රතිපාදන**

අ. අ.	වැඩසටහන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදල රු.
01	අවුරුදු 70 ව ඉක්ම වූ වැඩිහිටියන් සඳහා රු.2,000/- ලබා දීම	11,803	283,272,000.00
02	සියවස් සපිරි රු.5,000/- දීමනා ගෙවීම	13	780,000.00

- **වැඩිහිටියන් සඳහා වන ජාතික අරමුදලින් සිදු කරන ලද වැඩසටහන්**

අ.අ.	වැඩසටහන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදල රු.
01	ස්වයං රැකියා ආධාර ලබා දීම	04	160,000.00
02	දිරිය පියස නිවාස ඉදි කිරීම	02	600,000.00
03	වැඩිහිටි ග්‍රාමීය කමිටු සවි බල ගැන්වීම සඳහා	01	100,000.00
04	වැඩිහිටියන් තම නිවස තුළ ජීවත් වීම සඳහා අවම පහසුකම් ලබා දීම		
	01. උකුවෙල	12	354,500.00
	02. යටවත්ත	12	539,020.00
	03. නාඋල	06	294,280.00
	04. රත්තොට	05	245,330.00
	05. අඹන්හගකෝරළේ	07	285,006.00
	06. ගලේවෙල	06	305,065.00
	07. දඹුල්ල	05	160,000.00
05	ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා	03	12,500.00
	එකතුව	**63**	**3,055,701.00**

➢ මුල් ළමාවිය සංවර්ධන අංශය

ප්‍රතිපාදන සහිතව සිදුකළ වැඩසටහන්

වැඩසටහන -: පෙර පාසල් ගුරුවරුන් දැනුවත් කිරීම

දිනය -: 2021/12/ 06 සිට 12 දක්වා

ස්ථානය -: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විල්ගමුව

දරණ ලද වියදම -: රු. 306,082.00





➢ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ජාතික භාෂා අංශය

අ.අ.	වැඩසටහන	වැඩසටහන් ගණන	ලබාදෙන ලද ප්‍රතිපාදන (රු.)	වැයකල මුදල (රු.)
01	භාෂා ප්‍රවර්ධන වැඩසටහන් (පාසල් තුළ)	4	-	-
02	රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම.	18	-	-
03	රාජ්‍ය නොවන සංවිධාන සහභාගිත්වයෙන් ග්‍රාමීය ප්‍රජාව සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	3	-	-
04	නාම පුවරු සැකසීම.	1	150,000.00	75,000.00
05	මාතලේ දිස්ත්‍රික්කයේ පුස්තකාල සඳහා පොත් ලබාදීම.	3	150,000.00	150,000.00
06	කාන්තාවන් මූලික කරගත් සහජීවන සහය ස්වයං රැකියා ව්‍යාපෘති	2	398,500.00	226,100.00
07	ජාතික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - දරුවන් සඳහා	1	400,000.00	396,900.00
	එකතුව	**32**	**1,098,500.00**	**848,000.00**

➢ ළමා හිමිකම් ප්‍රවර්ධන අංශය

අ.අ	ක්‍රියාත්මක සැලැස්මට අනුව වගකීම් ක්ෂේත්‍රය / ක්‍රියාකාරකම්	වෙන් කල ප්‍රතිපාදන (රු.)	වැය කල මුළු ප්‍රතිපාදන (රු.)	ප්‍රගතිය (%)
1	ප්‍රගතිය සමාලෝචනය කර, එහි වාර්තාව හා මාසිකව ඉටුකරන ලද රාජකාරි පිළිබඳව සාරාංශ වාර්තාවක් ප්‍රධාන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	27,000.00	25,000.00	83.33
2	ළමා ආරක්ෂාවට අදාළ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ ළමා අපයෝජන වැලැක්වීම සඳහා සමාජ බලගැන්වීමේ වැඩසටහන් පැවැත්වීම අවශ්‍ය මහ පෙන්වීම ලබා දීම	-	-	100
3	ග්‍රාමීය කමිටු හා ළමා සමාජ දරුවන් සම්බන්ධ කරගනිමින් ප්‍රධාන නගර වල පොදුවාහන හා ස්ථානවල ප්‍රජාව දැනුවත්ව වන ආකාරයට ස්ටිකර ඇලවීම	30,000.00	30,000.00	100
4	ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් පවත්වන ළමා සමාජ සක්‍රීය පවත්වාගැනීම යාවත්කාලීන කිරීම හා ලියාපදිංචි කිරීම	40,000.00	40,000.00	100
5	ග්‍රාමීය කමිටු ක්‍රියාත්මක කිරීම	18,555.00	18,555.00	63.64
6	ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම	20,000.00	18,555.00	100
7	දිස්ත්‍රික් කමිටුව ක්‍රියාත්මක කිරීම	9,000.00	9,000.00	25
8	පාසල් නොයන ළමුන් පාසල් ගත කිරීම	-	-	100
9	වතු දරුවන්ගේ සෞඛ්‍ය සනිපාරක්ෂාව ප්‍රවර්ධනයකිරීම අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම.	60,000.00	60,000.00	66.67
10	ඉතා කඩිනමින් හදුනාගත් පවුල් සඳහා අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම	-	-	100
11	දරුවන්ගේ ගැටළු අවම කිරීම හා සුභසාධන අවශ්‍යතා සපිරීම	-	-	100
12	දරුවන්ගේ ගැටළු අවම කිරීම හා සුභසාධන අවශ්‍යතා සපිරීම	-	-	100
13	කොටියාශ මට්ටමින් ක්‍රියත්මක කරන ආදර්ශ ගම්මාන ව්‍යාප්ත කිරීමටඅවශ්‍ය පියවර ගැනීම	-	-	100
14	ක්ෂේත්‍ර විමර්ශනයන් කරමින් අවශ්‍ය මැදිහත්වීම	-	-	100
	එකතුව	204,555.00	201,110.00	

➢ උපදේශන කටයුතු - සමෘද්ධි හා ගෘහ ආර්ථික රාජ්‍ය අමාත්‍යාංශය

- **සිදු කරන ලද උපදේශන සේවා කටයුතු හා උපදේශන වැඩසටහන් - 2021**

කාරණය	වැඩසටහන් ගණන	ප්‍රතිලාභීන් ගණන	
උපදේශන වැඩසටහන්	32		1284
තනි පුද්ගල උපදේශනය		නව සේවාලාභීන්	40
		නැවත පැමිණි සේවාලාභීන්	120
		එකතුව	**160**

- **දිස්ත්‍රික්කය තුළ පැවැත්වූ උපදේශන වැඩසටහන්**

අ.අ	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	වැඩසටහන	දිනය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	උකුවෙල නවරත්නගොඩ හා පනන්තඩිය ග්‍රාම නිලධාරී වසම්	තල හා මුරුක්කු නිෂ්පාදන කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම සඳහා	2021.10.24	35
02	මාතලේ දුන්කලවත්ත හා දොරකුඹුර ග්‍රාම නිලධාරී වසම	ගම්මිරිස් හා ඉහුරු වගා කරුවන් සඳහා	2021.11.02	81
03	මාතලේ රජ්ජම්මන ග්‍රාම නිලධාරී වසම	මී මැසි පාලන කරුවන් සඳහා	2021.11.16	22
04	ලග්ගල රණමුරේ ග්‍රාම නිලධාරී වසම	ගම්මිරිස් හා අගය එකතු කිරීමේ නියලෙන්නන් සඳහා	2021.10.25	20
05	උකුවෙල ලැලිඅඹේ ග්‍රාම නිලධාරී වසම	ලාක්ෂා කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි ගෘහ ආර්ථික රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් නීල් බණ්ඩාර හපුහින්න මහතාගේ පැමිණීම	2021.12.05	



ලාක්ෂා කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි ගෘහ ආර්ථික රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් නීල් බණ්ඩාර හපුහින්න මහතාගේ පැමිණීම



ගම්මිරිස් හා අගය එකතු කිරීමේ නියලෙන්නන් සඳහා උපදේශන වැඩසටහන

➢ වනිතා කටයුතු සංවර්ධන අංශය

අ.අ.	වැඩසටහන	ප්‍රතිපාදන ලබාදුන් ආයතනය	ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය (රු,)	වැඩසටහන පැවැත් වූ දිනය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
01	ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පැවති නිෂ්පාදන ප්‍රදර්ශනය හා අළෙවි පොළ	ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය	100,000.00	2021/03/01 සිට 2021/03/05 දක්වා	75
02	පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයන්හි රාජකාරියේ නියුතු නිලධාරීන් සඳහා ස්ත්‍රී / පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය	15,000.00	2021.11.29	41



නිෂ්පාදන ප්‍රදර්ශනය හා අළෙවි පොළ



දැනුවත් කිරීමේ වැඩසටහන

➢ පුපුරන ද්‍රව්‍ය පාලන අංශය

- **ගිනි අවි බලප ත්‍ර**

අ.අ.	ඉටු කල කාර්යයන්	ප්‍රගතිය	
		ප්‍රමාණය	මූල්‍ය (රු)
01	ගිනි අවි බලපත්‍ර වාර්ෂිකව අලුත් කිරීම		
	කෘෂිකාර්මික කටයුතු සඳහා	1196	119,600.00
	කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා	94	18,800.00
02	මුරකරු බලපත්‍ර සඳහා	105	1,050.00
03	නැතිවීම් සහතික නිකුත් කිරීම	2	20.00
04	නව ගිනි අවි බලපත්‍ර අයදුම්පත් නිකුත් කිරීම	100	1,000.00
එකතුව			140,470.00

- **පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම**

අ.අ.	ඉටු කල කාර්යයන්	ප්‍රගතිය	
		ප්‍රමාණය	මූල්‍ය (රු)
01	වානිජමය බණිජ කැණීම් කර්මාන්ත සඳහා	116	185,500.00
02	වානිජමය නොවන කාර්යයන් සඳහා	17	9,500.00
03	ව්‍යාපෘති සඳහා	11	37,000.00
04	ගිනි පෙට්ටි නිෂ්පාදනය සඳහා	02	6,000.00
05	නිකුත් කළ අවසරපත්‍ර සඳහා අමතර පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණ ලබා ගැනීම්	05	5,000.00
එකතුව		151	243,000.00

- **පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම**

අ.අ.	ඉටු කල කාර්යයන්	ප්‍රගතිය	
		ප්‍රමාණය	මූල්‍ය (රු)
01	ගිනි කෙළි භාණ්ඩ නිෂ්පාදනය සඳහා	01	2,200.00
02	ගිනි කෙළි භාණ්ඩ විකිණීම සඳහා	52	31,750.00
03	බලයලත් පුපුරණ ද්‍රව්‍ය අලෙවි නියෝජිතයින් සඳහා	03	33,000.00
එකතුව		56	66,950.00

➢ අභ්‍යන්තර විගණන අංශය

- **ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත විගණන විමසුම් යොමු කිරීම සහ පිළිතුරු ලබා ගැනීම පිළිබඳ තොරතුරු**

අ.අ.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	විගණන විමසුම් ගණන	අභ්‍යන්තර විගණන විමසුම් යැවූ දිනය
01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	03	2021/09/07 - 2021/10/09
02	යටවත්ත	01	2021/12/22
03	අඹන්ගහකොර්ලේ	02	2021/08/26 - 2021/11/16
04	ගලේවෙල	03	2021/05/04 - 2021/07/12
05	දඹුල්ල	04	2021/03/30 - 2021/03/16 - 2021/08/31
06	පල්ලේපොල	02	2021/03/16 - 2021/12/31
07	ලග්ගල	02	2021/08/03
08	මාතලේ	04	2021/03/08 - 2021/03/11 - 2021/09/29
09	නාඋල	03	2021/03/08 - 2021/03/22
10	රත්තොට	02	2021/12/20
11	විල්ගමුව	02	2021/07/12 - 2021/12/31
12	උකුවෙල	03	2021/09/29 - 2021/11/29 - 2021/12/31

- **විගණනය කල ආයතන**

අ.අ.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/දි.ලේ.කා.	අභ්‍යන්තර විගණනය සිදු කල දිනය
01	රත්තොට	2021/11/03, 05
02	දඹුල්ල	2021/02/23 - 2021/02/17, 18 - 2021/11/29
03	ගලේවෙල	2021/03/29, 30 - 2021/04/06 - 2021/11/30 - 2021/12/02
04	උකුවෙල	2021/11/01, 02
05	මාතලේ	2021/01/26, 27, 29
06	යටවත්ත	2021/10/12, 13, 15
07	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	2021/03/
08	නාඋල	2021/02/05, 08 - 2021/12/07, 09
09	අඹන්ගහකෝරලේ	2021/11/12, 13, 14
10	විල්ගමුව	2021/02/24 - 2021/03/24 - 2021/11/25
11	ලග්ගල	2021/07/15
12	පල්ලේපොල	2021/02/09, 10 - 2021/12/06

- **2021 වර්ෂයේදී පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු**

අ.අ.	දිනය	ස්ථානය
01	2021.03.16	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
02	2021.04.23	
03	2021.12.14	
04	2021.03.11	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාතලේ
05	2021.10.15	
06	2021.03.31	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - උකුවෙල
07	2021.08.05	
08	2021.03.29	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රත්තොට
10	2021.08.16	
12	2021.03.29	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අඹන්ගහකෝරළේ
13	2021.08.10	
14	2021.03.04	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ලග්ගල
15	2021.08.03	
16	2021.03.04	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - විල්ගමුව
17	2021.08.03	
18	2021.02.18	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දඹුල්ල
19	2021.08.18	
20	2021.02.18	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාඋල
21	2021.10.31	
22	2021.02.09	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගලේවෙල
23	2021.10.13	
24	2021.03.09	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - යටවත්ත
25	2021.08.05	

- **දිසාපති නියෝග නිකුත් කිරීම - 2021**

අ.අ.	කාරණය	නියෝග අංකය
01	වැන්දඹු/ වැන්දඹු පුරුෂ/ අනත්දරු/ ආබාධිත අනත්දරු/ විශ්‍රාම වැටුප් හිමිකම් ලබන්නන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් කඩිනම් කිරීම	01/2021
02	ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් භාණ්ඩ වැඩ හා සේවා ලබා දීම	02/2021
03	වාර්ෂික ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති වල කාර්ය සාධනය වඩාත් ඵලදායිව ක්‍රියාත්මක කිරීම	03/2021

➢ ඉංජිනේරු අංශය

අ.අ.	කාරණය	ඇස්තමේන්තුගත වටිනාකම (රු.)	ගිවිසුම්ගත මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය (%)
01	අංක 99/12 නිල නිවස අළුත්වැඩියාව	145,078.20	143,647.43	141,714.24	100
02	අංක 99/09 නිල නිවස අළුත්වැඩියාව	98,194.54	98194.54	99,845.34	100
03	අංක 99/10 නිල නිවස අළුත්වැඩියාව	237,119.96	237,119.96	216,341.86	100
04	අංක 99/15 නිල නිවස අළුත්වැඩියාව	147,281.95	142,843.74	122,968.20	100
05	අංක 99/11 නිල නිවස වහලය අළුත්වැඩියාව	109,764.91	109,764.91	104,144.59	100
06	අංක 99/11 නිල නිවස අළුත්වැඩියාව	189,816.20	189,816.20	199,743.12	100
07	අංක 99/16 නිල නිවස අළුත්වැඩියාව	164,710.73	164,710.73	145,331.54	100
08	අංක 99/14 නිල නිවස අළුත්වැඩියාව	294,146.6	294,146.60	322,116.77	100
09	අංක 30/15 නිල නිවස පූනික වල ඉදිකිරීම	72,743.30	72,743.30	71,323.53	100

10	අංක 30/14 නිල නිවස පූනික වල ඉදිකිරීම	61,268.07	60,066.71	49,669.56	100
11	අංක 30/14 නිල නිවස වහලය අළුත්වැඩියාව	50,521.17	50,521.17	43,452.50	100
12	දිස්ත්‍රික් විද්‍යා කාර්යාලය අළුත්වැඩියාව	358,704.42	358,704.42	358,704.42	100
13	මිරිස්ගෝණියාඔය ප්‍රතිසංස්කරණය I අදියර	14,412,474.87	11,468,854.20	8,677,338.10	100
14	මිරිස්ගෝණියාඔය ප්‍රතිසංස්කරණය II අදියර	2,998,400.00	2,955,650.00	2,916,827.55	100
15	වගා ළිඳ ඉදිකිරීම (බත්ගම්පල වසම)	2,339,842.56	2,300,837.96	2,016,704.00	100
16	වගා ළිඳ ඉදිකිරීම(හිඹිලියාකඩ වසම)	2,339,842.56	2,300.837.96	2,034,911.00	100
17	වගා ළිඳ ඉදිකිරීම(හිඹිලියාකඩ වසම)	2,339,842.56	2,300.837.96	1,962,163.80	100
18	වගා ළිඳ ඉදිකිරීම(කුඹුකන්දන වසම)	2,339,842.56	2,300.837.96	1,966,657.05	100
19	වගා ළිඳ ඉදිකිරීම(රදුන්නේවැව වසම)	2,339,842.56	2,300.837.96	2,018,879.50	100
20	වගා ළිඳ ඉදිකිරීම (අලිවංගුව වසම)	2,339,842.56	2,300.837.96	1,837,011.50	100
21	ලග්ගල සංචාරක නිවාසය ඉදිකිරීම	9,700,405.77	9,536,364.94	10,282,113.73	70
22	තෙමහල් නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම	45,473,750.32	37,809,975.00	21,371,830.27	60
23	අලුවිහාරය හෙළ බොජුන් හල ඉදිකිරීම	4,909,450.00	4,779,517.80	4,812,878.46	400
24	රත්තොට අතිරේකබෝග ගබඩාව ඉදිකිරීම	11,454,430,68	11,441,901,88	2,571,306.00	60
